වාර්ෂික වාර්තාව සහ ගිණුම්
வருடாந்த அறிக்கையும் கணக்கும்
ANNUAL REPORT AND ACCOUNTS

2015

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
உள்ளூர் கடன்கள் மற்றும் அபிவிருத்தி நிதியம்
LOCAL LOANS AND DEVELOPMENT FUND

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிஅமைச்சு

Ministry of Internal & Home Affairs and Provincial Councils & Local Government

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2015

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දැක්ම

පළාත් පාලන බලප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් බවට පත්වීම.

පටුන

පිටුව

1. කොමසාරිස් මණ්ඩලය 05
2. දර්ශනය, මෙහෙවර, අරමුදල්, සංස්ථාපනය, අරමුණු 06
3. ආයතනික තොරතුරු 07
4. පාලන ක්‍රියාවළිය 08
5. මෙහෙයුම් හා මූල්‍ය විග්‍රහය 11
6. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති 25
7. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 27

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

8. විගණකාධිපති වාර්තාව 29
9. විස්තීරණ ආදායම් ප්‍රකාශනය 40
10. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 41
11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 43
12. ගිණුම්කරණ සටහන් 44
13. ගිණුම්කරණ ප්‍රතිපත්ති 51

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

කොමසාරිස් මණ්ඩලය

(2015.12.31 දිනට)

සභාපති

01. එච්.ටී.කමල් පත්මසිරි මහතා - ලේකම්, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

භාණ්ඩාගාර නියෝජනය

02. ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මහතා - අධ්‍යක්ෂ , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජිකයින්

03	එච්.එම්.බී.පී.හේරත් මහතා	පළාත් පාලන කොමසාරිස්	(වයඹ පළාත)
04	එම්.එස්.ප්‍රේමවංශ මහතා	ප්‍රධාන ලේකම්	(මධ්‍යම පළාත)
05	කේ.ඒ.තිලකරත්න මහතා	ප්‍රධාන ලේකම්	(උතුරු මැද පළාත)
06	එස්.ජේ.එම්.එච්.සී.සමරකෝන් මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(බස්නාහිර පළාත)
07	ගාමිණී රාජකරුණා මහතා	ප්‍රධාන ලේකම්	(ඌව පළාත)
08	එච්.පී.කුලරත්න මහතා	ප්‍රධාන ලේකම්	(සබරගමුව පළාත)
09	ඩී.එම්.එස්.අබේගුණවර්ධන මහතා	ප්‍රධාන ලේකම්	(නැගෙනහිර පළාත)
10	ඒ.පතිනාතන් මහතා	ප්‍රධාන ලේකම්	(උතුරු පළාත)
11	ආර්.සී.ද සොයිසා මහතා	ප්‍රධාන ලේකම්	(දකුණු පළාත)
12	පී.රූපසිංහ මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
13	එස්.ඒ.අබේසිංහ මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	

වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2015

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

අරමුදල්

ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් නිකුත් කරනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) සහ 2201 SRI (SF) සඳහා වන චක්‍රීය අරමුදල් ද ණය නිකුත් කිරීම සඳහා උපයෝගී වී ඇත. 2009 වර්ෂයේදී රු.මි.25 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇති අතර ඉන් පසු කිසිඳු අරමුදලක් ලබාගෙන නොමැත.

ආයතනික තොරතුරු

සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර නැවත 2015 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන සහ ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය යටතේ පාලනය විය.

කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 ක් සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

ලියාපදිංචි ස්ථානය	**නො. 24/A, වෝඩ් පෙදෙස, කොළඹ 07**
දුරකථනය	011-2687514
ෆැක්ස්	011-2691261
විද්‍යුත් තැපැල්	lldf1916@gmail.com

කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ අංක 2 ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන එක් අයෙකු
(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු
(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

විගණකවරු: විගණකාධිපති දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණනය: අභ්‍යන්තර විගණන අංශය - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
බැංකු කරුවෝ: ලංකා බැංකුව

කාර්ය මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

ප්‍රධාන විධායක නිලධාරී	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	01
සහකාර ගණකාධිකාරී	01
සංවර්ධන නිලධාරී	17
කළමනාකරණ සහකාර	06
රියදුරු	01
කාර්යාල කාර්ය සහායක	02
එකතුව	**29**

පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය, ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

කොමසාරිස් මණ්ඩලය

සංයුතිය

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැණුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරී වේ. කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධවී නැති අතර එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

තීරණ ගැනීම

කොමසාරිස්මණ්ඩල සාමාජිකයින් මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තිරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලඟාකරගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ඇත.

වගකීම

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරිත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවළිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

ස්වාධීන විනිශ්චය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිලිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්යසාධන සමාලෝචනය සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන්ගේ අවධානය යොමුවේ.

සභාපති

සභාපතිගේ කාර්යභාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර එමගින් ආයතන රාමුව තුල එනිසා බල තුලනයක් නිර්මාණය වී ඇත. පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

සභාපතිගේ කාර්යභාරය

සභාපතිගේ නායකත්වය යටතේ කොමසාරිස් මණ්ඩලය නියමිත උපායමාර්ග වෙත මගපෙන්වීම සහිතව වෘත්තීමය ස්වභාවයෙන් කටයුතු කිරීමට සලස්වා ඇත. කොමසාරිස් මණ්ඩලය වෘත්තීමය ආකාරයෙන් මෙහෙයවීම හා මග පෙන්වීම සඳහා නායකත්වය දීමට ඔහුට හැකියාව ඇත.

කොමසාරිස් මණ්ඩලය පත්කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

විගණනය සහ වගකීම

ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ "සී" පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකු බඳවාගැනීමට කටයුතුකර ඇත.

මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැණුවත් වී ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධව කලින් කල සිදුකරණ විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ව්‍යවස්ථාපිත බැදීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැණුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැදීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැදීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිලිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගීකරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

2015 වර්ෂයේ කාර්යසාධනය

2015 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.500 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 24 ක් වෙත නිකුත් කළ මුළු ණය වටිනාකම රු.මි.292 කි. පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම ප්‍රතිශතයක් ලෙස ගත්කළ 58% කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ.

2015 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය පහත දැක්වේ;

	ව්‍යාපෘති වර්ගය	පොළී ප්‍රතිශතය (වාර්ෂික)	මුදල (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව
1	මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම	9.0%	47,498,400	06
2	ආදාහනාගාර ඉදිකිරීම	6.5%	18,605,000	07
3	පොදු වෙළඳපළ ඉදිකිරීම	9.0%	220,975,270	08
4	සතිපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති	6.5%	2,500,000	01
5	වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති	9.0%	3,011,000	02
	එකතුව		**292,589,670**	**24**

ආදායම

උපයාගන්නා ලද දළ ආදායම රු.මි.126 කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත්කළ ණය මුදල් ද ඇතුළුව). ඊට අමතරව රාජ්‍ය බැංකුවල චක්‍රීය අරමුදල් ආයෝජනය කිරීමෙන් රු.මි.21.9 ක් ද උපයාගෙන ඇත. ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු ශුද්ධ ලාභය රු.මි.9.6 කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන 89 කි) තවද 2015 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.26 කි. ඒ අනුව බදු පෙර ලාභය රු.මි.**5**.1 කි.

2015 වර්ෂය තුල පොළී ආදායම, ආයෝජන ආදායම සහ මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම (ව්‍යාපෘති අනුව)

(රු.මි)

	LLDF	PCDP	UDLIHP	LGIIP	මුළු එකතුව
පොළී ආදායම	81.3	4.9	71.2	121.4	278.8
මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	16.9	4.9	95.3	35.5	152.6

2015 වර්ෂය තුල ආයෝජන ආදායම් පහතින් දැක්වේ

(රු.මි)

	LLDF	UDLIHP	LGIIP	මුළු එකතුව
භාණ්ඩාගාර බිල්පත්	0.9	2.3	0.8	4.0
ස්ථාවර තැන්පතු පොළී	11.3	0.1	0.09	11.49
අරමුදල් කළමනාකරණ ගිණුම	0.7	0.8	1.1	2.6
REPO ආයෝජන	0.7	1.1	1.5	3.3
එකතුව	13.6	4.3	3.49	21.39

පසුගිය වර්ෂ 05 ක දළ ආදායම - 2011 - 2015

(රු.මි)

වර්ෂය	බදු ගෙවීමට පෙර දළ ලාභය (රුපියල් මිලියන)
2011	(47.0)
2012	(335.4)
2013	(246.4)
2014	(134.1)
2015	5.1

භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2015 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.22.2 ක් සහ රු.මි.16.9 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.90.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.95.3 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.35.5 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.1.6 ක් ණය වාරික වශයෙන් ද රු.මි.4.9 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

(රු.මි)

	වාරික ගෙවීම්	පොළී ගෙවීම්	එකතුව
LLDF	22.2	16.9	39.1
PCDP	1.6	4.9	6.5
UDLIHP	90.8	95.3	186.1
LGIIP	-	35.5	35.5
එකතුව	114.6	152.6	267.2

ණය ආපසු අයකිරීම

වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ චක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.126.6 ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.**75.6** ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.**94.7** ක් ණය වාරික වශයෙන් ද රු.මි.69.4 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.3.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි. 4.9 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.110.2 ක් වාරික වශයෙන්ද රු.මි. 104.4 ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

(රු.මි)

	වාරික අයකිරීම්	පොළී අයකිරීම්	එකතුව
LLDF	126.6	75.6	202.2
PCDP	3.8	4.9	8.7
UDLIHP	94.7	69.4	164.1
LGIIP	110.2	104.4	214.6
එකතුව	335.3	254.3	589.6

දේශීය ණය සහ සංවර්ධන අරමුල
2015.12.31 දිනට ණය නිකුත් කිරීම

අංක	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	සතිපොළ ඉදිකිරීම සහ සංවර්ධනය	ආදාහනාගාර ඉදිකිරීම	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති
1	කහවත්ත ප්‍රා.ස	සබරගමුව	6,200,000				6,200,000	
2	කෝට්ටේ ම.න.ස	බස්නාහිර	189,000,000				189,000,000	
3	මන්මුනායි බටහිර ප්‍රා.ස	නැගෙනහිර	6,720,000			6,720,000		
4	පෑලියගොඩ න.ස	බස්නාහිර	9,080,000			9,080,000		
5	ගලිගමුව ප්‍රා.ස	සබරගමුව	8,938,400			8,938,400		
6	තිරුක්කෝවිල් ප්‍රා.ස	නැගෙනහිර	944,000					944,000.00
7	බිබිල ප්‍රා.ස	ඌව	848,000				848,000	
8	කලවාන ප්‍රා.ස	සබරගමුව	900,000				900,000	
9	තලවකැලේ ලිඳුල න.ස	මධ්‍යම	925,000		925,000			
10	යටියන්තොට ප්‍රා.ස	සබරගමුව	1,900,000		1,900,000			
11	ගල්ගමුව ප්‍රා.ස	වයඹ	3,500,000		3,500,000			
12	මන්මුනායි නිරිත ප්‍රා.ස	නැගෙනහිර	9,400,000			9,400,000		
13	අඹගමුව ප්‍රා.ස	මධ්‍යම	6,372,270				6,372,270	
14	නාත්තණ්ඩිය ප්‍රා.ස	වයඹ	10,000,000			10,000,000		
15	තමන්කඩුව ප්‍රා.ස	උතුරු මැද	16,000,000				16,000,000	
16	මහර ප්‍රා.ස	බස්නාහිර	2,700,000		2,700,000			
17	දෙහිඕවිට ප්‍රා.ස	සබරගමුව	2,500,000	2,500,000				
18	තුම්පනේ ප්‍රා.ස	මධ්‍යම	1,175,000				1,175,000	

අංක	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	සතිපොළ ඉදිකිරීම සහ සංවර්ධනය	ආදාහනාගාර ඉදිකිරීම	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති
19	පාතහේවාහැට ප්‍රා.ස	මධ්‍යම	2,330,000		2,330,000			
20	බිබිල ප්‍රා.ස	ඌව	480,000				480,000	
21	කොටපොල ප්‍රා.ස	දකුණ	3,360,000			3,360,000		
22	මහර ප්‍රා.ස	බස්නාහිර	4,470,000		4,470,000			
23	මහියන්ගන ප්‍රා.ස	ඌව	2,780,000		2,780,000			
24	අත්තනගල්ල ප්‍රා.ස	බස්නාහිර	2,067,000					2,067,000.00
	එකතුව		292,589,670	2,500,000	18,605,000	47,498,400	220,975,270	3,011,000.00

ණය නිකුත් කිරීම - පළාත් අනුව (2015 වර්ෂය)

පළාත	මුදල (රු.)	ප්‍රතිශතය (%)
බස්නාහිර	207,317,000	71
දකුණු	3,360,000	01
වයඹ	13,500,000	05
මධ්‍යම	10,802,270	04
සබරගමුව	20,438,400	07
උතුරු මැද	16,000,000	05
ඌව	4,108,000	01
නැගෙනහිර	17,064,000	06
එකතුව	**292,589,670**	**100**



ණය නිකුත් කිරීම - 2015 වර්ෂය

පළාත් පාලන ආයතන වර්ගය අනුව

පළාත් පාලන ආයතන වර්ගය	මුදල (රු.)	ප්‍රතිශතය (%)
මහ නගර සභා	189,000,000	23
නගර සභා	10,005,000	08
ප්‍රාදේශීය සභා	93,584,670	69
එකතුව	292,589,670	100



දේශීය ණය සහ සංවර්ධනඅරමුදල
මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් **2011 - 2015**

රුපියල් මිලියන

වර්ෂය	වාරික				පොළිය				මුළු එකතුව
	LLDF	PCDP	UDLIHP	LGIIP	LLDF	PCDP	UDLIHP	LGIIP	
2011	22.9	1.15	56.2	-	23.5	6.0	67.2	34.7	211.6
2012	22.9	1.26	109.6	-	21.8	7.6	90.8	29.0	283.0
2013	22.8	1.02	90.8	-	20.4	5.8	99.0	35.6	275.4
2014	22.5	3.80	90.8	-	18.6	5.2	100.0	35.0	275.9
2015	22.2	1.60	90.8	-	16.9	4.9	95.3	35.5	267.2
එකතුව	113.3	8.83	438.2	-	101.2	29.5	452.3	169.8	1313.1

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ (LGIIP) නිකුත්කළ ණය මුදල් සඳහා සහන කාලය තුලදී පොළිය පමණක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීම කරනු ලැබේ.

LLDF	දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය
PCDP	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල්
UDLIHP	නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP	පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2011 – 2015
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2011	22.9	23.5
2012	22.9	21.8
2013	22.8	20.4
2014	22.5	18.6
2015	22.2	16.9



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2011 –2015
බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2011	1.15	6.0
2012	1.26	7.6
2013	1.02	5.8
2014	3.80	5.2
2015	1.60	4.9



මහා භාණ්ඩාගාරය වෙත ණයආපසු ගෙවීම් 2011–2015

නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2011	56.2	67.2
2012	109.6	90.8
2013	90.8	99.0
2014	90.8	100.0
2015	90.8	95.3



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2011–2015
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

රුපියල් මිලියන

වර්ෂය	මහා භාණ්ඩාගාරය වෙත පොළී ගෙවීම්
2011	34.7
2012	29.0
2013	35.6
2014	35.0
2015	35.5



දේශීය ණය සහ සංවර්ධන අරමුදල
කාර්ය සාධනය 2011 - 2015

රු.'000

වර්ෂය	නිකුත් කළ ණය	ණය වාරික අයකිරීම්	ණය පොළී අයකිරීම්
2011	105,707	131,766	49,899
2012	76,249	115,281	51,231
2013	225,479	124,086	54,394
2014	303,392	130,626	53,694
2015	292,589	126,671	75,639







ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) - (UDLIHP)
නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් 70% ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැන නැගී ඇති වීමත්ය.

පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP)

(රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2011	71.7	102.4
2012	76.6	93.5
2013	82.4	90.3
2014	89.6	80.0
2015	94.7	69.4

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF)
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයත වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකර ගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන ඇත.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන්නේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් වන අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව
2015 වර්ෂය

2005.07.01 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./31 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ. ප්‍රධාන විධායක නිලධාරී කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ.

(01) 2012 සහ 2013 වර්ෂවල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

2012 සහ 2013 වර්ෂවල අවසාන ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුව පිළියෙල කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබාදී ඇත. ඒ අනුව පළපුරුදු වෘත්තීය ගණකාධිකරණ ආයතන තුනකින් මිල ගණන් ලබාගෙන ඇති අතර අවම මිල ඉදිරිපත් කර ඇති Ernst & Young ආයතනය මගින් ගිණුම් සැකසීම සුදුසු බවට උපදෙස් ලබාදීම.

(02) අභ්‍යන්තර විගණක තනතුර

ආයතනයේ දැනට පවතින අනුමත බඳවාගැනීමේ පරිපාටියේ අභ්‍යන්තර විගණකවරයෙකු සඳහා තනතුරක් නොමැති බැවින් මෙම කාර්යය ආයතනය පාලනය වන අමාත්‍යාංශය මගින් මෙතෙක් සිදුකර ඇත. එමෙන්ම මෙම ආයතනය මූල්‍ය ආයතනයක් බැවින් ඉදිරියේදී බඳවාගැනීමේ පරිපාටිය සංශෝධන කිරීමේදී අභ්‍යන්තර විගණක තනතුරක් ඇතිකර අභ්‍යන්තර විගණන අංශයක් ඇති කිරීම සුදුසු බවට යෝජනා කිරීම.

(03) 2015 වර්ෂයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

ආයතනයේ 2015 -2020 කාලපරිච්ඡේදයට අදාළ සංයුත්ක සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

(04) පරිගණක මෘදුකාංග පද්ධතිය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ඉටුකරගැනීමේදී ඉහළ කළමනාකරණයට වඩාත් නිවැරදි තීරණ ගැනීම සඳහා වඩාත් සත්‍ය වූ නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව කමිටුව විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව දැනට පවතින පද්ධතියේ අඩුපාඩු සකස් කරගනිමින් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් විධිමත් පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදීම.

2015 වර්ෂයේ කමිටු සාමාජිකයින්

ඩබ්.එම්.පී.ජී.වික්‍රමසිංහ මහතා	අති.ලේ. (පළාත් පාලන) - **රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය**	සභාපති
ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මහතා	භාණ්ඩාගාර නියෝජනය	සාමාජික
එස්.එන්.ආර්.සුහසිංහ මහතා	ප්‍රධාන විධායක නිලධාරී - දේශීය ණය සහ සංවර්ධන අරමුදල	සාමාජික
ආර්.එම්.ධර්මලතා මහත්මිය	අභ්‍යන්තර විගණක (පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය)	සාමාජික
ඊ.ජී.එන්.පී.එදිරිසිංහ මහත්මිය	විගණකාධිපති දෙපාර්තමේන්තුව	නිරීක්ෂක

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No.	ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/ එල්එල්ඩීඑෆ්/එෆ්ඒ/2015	
ඔබේ අංකය உமது இல. Your No.		
දිනය திகதி Date	2018 සැප්තැම්බර් 21 දින	

සභාපති,

දේශීය ණය සහ සංවර්ධන අරමුදල.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

03 OCT 2018

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කල යුතු වුවද 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වසරක ප්‍රමාදයකින් පසුව 2017 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සභාපති, විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු අත්සන් කර තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණයේ වගකීම පිළිබඳ සහතිකය ඇතුළත් කර නොතිබුණි.

2.2.2 ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම

අරමුදල විසින් විධිමත් පරිදි ගිණුම් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ගිණුම්ගත කළ යුතු සියලු ගනුදෙනු ලෙජර් ගිණුම්වලට ඇතුළත් කිරීම හා වර්ෂ අවසානයේ ලෙජර් ගිණුම් තුලනය කිරීම සිදුකර නොතිබුණි. එබැවින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂවල නිවැරදිතාවය ලෙජර් ගිණුම්වලින් සනාථ කර ගැනීමට විගණනයේදී නොහැකි වූ අතර අවිනිශ්චිත ලැබීම් ලෙස රු.22,063,699 ක් ජංගම වගකීම් යටතේ දක්වා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුලනය කර තිබුණි.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 10 ඡේදය ප්‍රකාරව, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 60 ඡේදය ප්‍රකාරව, වත්කම්/වගකීම් ද්‍රවශීලතාවයේ අනුපිළිවෙලට වර්ගීකරණය කළහැකි බව දක්වා තිබුණ ද, ආයතනයේ ක්‍රියාකාරීත්වය මූල්‍ය ආයතනයක ක්‍රියාකාරීත්වයට සමාන වන බැවින් ඒ පිළිබඳ අවධානය යොමුකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 61 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අපේක්ෂා කරන අයිතමයන් වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව මාස 12 නොඉක්මවූ සහ මාස 12 ඉක්ම වූ ලෙස මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත් කාර්ය මණ්ඩල ණයගැතියන්, අනෙකුත් ණයගැතියන් හා භාණ්ඩාගාරයෙන් ලබාගත් ණය සම්බන්ධයෙන් ප්‍රමිතියේ ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 117 (ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට භාවිතා කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කළයුතු වුවද, මූල්‍ය වත්කම් සහ බදුකරණය සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබූ අතර දේපල, පිරියත සහ උපකරණ සඳහා හෙළිදරව් කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්තියෙන් සම්පූර්ණ තොරතුරු සපයා නොතිබුණි.

4

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බදු වියදමේ ප්‍රධාන කොටස් වෙන වෙනම හඳුනාගෙන හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සුදුසු තත්ත්වයට ගෙන ආ ආපසු ආරම්භ කළයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස වත්කම මිලදී ගත් වර්ෂයේදී ක්ෂය නොකරන බව දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 73(ඈ) ඡේදය ප්‍රකාරව, සියලුම වත්කම් පන්ති සඳහා භාවිතා කරන ඵලදායී ජීව කාලය හෝ ක්ෂය අනුපාතය හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද පරිගණක මෘදුකාංග, දෘඩාංග සහ නවීකරණ වත්කම් සඳහා ක්ෂය අනුපාතය හෝ ඵලදායී ජීවිත කාලය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 140(අ), 141(අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව, ශුද්ධ ප්‍රතිලාභයේ වගකීම් (වත්කම්), වර්තමාන සේවා පිරිවැය, පොලී ආදායම හෝ වියදම, ශුද්ධ ප්‍රතිලාභයේ වගකීමේ / වත්කමේ නැවත ගණනය සහ අතීත සේවා පිරිවැය ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සැසඳුමක් වශයෙන් හෙළිදරව් කළයුතු වුවද එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය ලෙස රු. 2,224,380 ක් ලියාහැර තිබුණ ද රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක අරමුදලේ කාර්යාලය පවත්වාගෙන ගොස් ඇති අතර රජයේ තීරණයක් මත පාකිස්තානු මහ කොමසාරිස් කාර්යාලයට මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම පවරා දී තිබුණි. එහෙත් අරමුදලට නීත්‍යානුකූල හිමිකමක් හෝ තාවකාලික හිමිකමක් නොමැති එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා අරමුදල විසින් දරන ලද රු.4,511,406 ක් ප්‍රාග්ධනීත කර තිබුණද එම වියදම කපාහැරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

2.2.5 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට පලාත් පාලන ආයතන වෙත ණය සහ ප්‍රදාන වශයෙන් ලබාදී තිබූ මුදල රු.1,482,905,606 ක්වූ අතර, මෙම ශේෂය තුල ඇතුලත් ප්‍රදාන වටිනාකම හඳුනාගෙන ලාභයට එරෙහිව ලියා හැරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 1,150,331 ක් වටිනා ලැප්ටොප් පරිගණක 07 ක වටිනාකම පරිගණක නඩත්තු ගිණුමට හර කර තිබීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණවල පිරිවැය සහ සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.144,082ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු.57,965,835ක් වූ ණය පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ස්ථාවර තැන්පතු යටතේ සෘජුවම ආයෝජනය කර තිබූ පොලී ආදායම රු.8,445,245 ක් ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම් එකී ප්‍රමාණයෙන් සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා රඳවාගත් ඉපයීම් පිළිවෙලින් රු.1,932,324 කින් හා රු.6,512,921 කින් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් පිරිවැයෙහි ආරම්භක ශේෂය ලෙස රු. 5,150,873 ක් දක්වා තිබුණ ද විගණනය වෙත ලබා දුන් උපලේඛනය අනුව එම ශේෂය රු.606,563 ක් වූයෙන් රු.4,544,310 ක වෙනසක් විය.

6

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, ණයගැති සහ ලැබිය යුතු ණය පොලී ශේෂයන් සහ අදාල උපලේඛන අනුව ශේෂයන් අතර රු. 389,178,319ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, බැංකු ජංගම ගිණුමක හා ඉතිරි කිරීමේ ගිණුමක ශේෂවල එකතුව රු. 180,963,215 ක් වුවද මුදල් පොත හා ශේෂ සනාථන අනුව එම ශේෂ රු.179,588,931 ක් වූයෙන් රු. 1,374,284 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

	විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ විගණන සාක්ෂි
(අ)	ස්ථාවර තැන්පතු ආයෝජන	24,640,898	ශේෂ තහවුරු කිරීම, ස්ථාවර තැන්පතු සහතිකය
(ආ)	කාර්යාල කුලී වෙන්කිරීම	7,200,000	විස්තරාත්මක ගණනය කිරීම් හා උපලේඛන
(ඇ)	ලැබිය යුතු ආයෝජන ආදායම (UDLIHP)	2,522,742	
(ඈ)	භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය පොලී	21,765,948	
(ඉ)	අවිනිශ්චිත ලැබීම්	22,063,699	
(ඊ)	අත්තිකාරම් ලැබීම්	15,623,577	

7

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම්
(අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම්වලට අදාල සියලු තොරතුරු නිවැරදිව ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක උපාංග පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,226,504 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 135,412,981 ක ඌනතාවයක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.139,639,484ක වර්ධනයක් ඇති වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානවලට අදාළ ශුද්ධ ක්‍රමක්ෂය රු. 105.219,502 කින් සහ ණය හානිකරණය ලෙස ලියා හැර ඇති වියදම් රු. 70,377,085 කින් අඩුවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ ඌනතාවයක් ඇති වී තිබූ නමුත් එම ඌනතාවය රු.337,504,858 ක සිට 135,412,981 ක් දක්වා අඩු වී සමාලෝචිත වර්ෂයේදී රු.4,226,504 ක අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා දේපළ පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සෘණ දායකත්වයක් ඇතිවී තිබූ නමුත් එය රු. 106,622,894 සිට 18,499,306 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු. 53,215,095 ක ධන අගයක් ලෙස වර්ධනය වී තිබුණි.

8

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව එම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතු වාර්ෂික අයවැය ලේඛනය (ආදායම්, මෙහෙයුම් වියදම්, සංවර්ධන වියදම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) යෝජිත ආයෝජන, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා (ප්‍රධාන ආයෝජන ධාරිතා පුළුල් කිරීම, ප්‍රධාන ප්‍රසම්පාදනයන්), මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම/ ණය අයකර ගැනීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා එම ආයතනවල ස්ථාවර වත්කම් සංවර්ධනය කිරීමට ණය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP), නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) සහ නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) මගින් ලබාදෙන ලද ණය මුදල් එකී පළාත් පාලන ආයතනවලින් පොළිය ද සමග අයකර මුල් මුදල සහ අය කරන පොළී මුදලෙන් කොටසක් භාණ්ඩාගාරයට ගෙවීමෙන් පසු ශේෂවන මුදලින් හා ආයතනය විසින් පළාත් පාලන ආයතන වෙත ණය ලබාදීම මගින් අය කරන පොළියෙන් අරමුදලේ ආදායම සමන්විත වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට අවුරුද්දකට වඩා වැඩි කාලයක් ක්‍රියාකාරී නොවූ ණය ලැයිස්තුවේ පැවති රු.648,882,366 ක් වූ ණය ශේෂ 38ක් අතුරින් 2015 වර්ෂයේදී රු. 116,968,939 ක වටිනාකමින් යුත් ණය ශේෂ 13ක් ප්‍රතිව්‍යුහගත කිරීම (Reschedule) සිදුකර තිබූ අතර ඉතිරි රු.531,912,427ක මුදල අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගය ණය ලබා දීම තුළින් උපයා ගන්නා පොළිය වන නමුත් සමාලෝචිත වර්ෂයේදී අලුත් ණය නිකුත් කිරීමට ප්‍රවර්ධන වැඩසටහන් සිදු කර නොතිබූ අතර රු. 27,800,000 ක වටිනාකමකින් යුත් ණය 3ක් පමණක් කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

9

(ඇ) ඉකුත් වර්ෂවලදී පළාත් අනුව අනුමත කර සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ ණය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

පළාත	ඇස්තමේන්තු මුදල (රු.)	සත්‍ය මුදල (රු.)	ප්‍රගතිය %
මධ්‍යම	50,000,000	10,802,270	22
නැගෙනහිර	40,000,000	7,664,000	19
උතුරු මැද	50,000,000	16.000,000	32
උතුර	70,000,000	9,400,000	13
දකුණ	60,000,000	3,360,000	6
වයඹ	120,000,000	13,500,000	11
සබරගමුව	20,000,000	20,438,400	102
ඌව	20,000,000	4,108,000	21
බස්නාහිර	70,000,000	207,317,000	296
එකතුව	500,000,000	292,589,670	

ණය ලබාදීම පළාත් වශයෙන් විශ්ලේෂණය කිරීමේදී බස්නාහිර පළාත සහ සබරගමුව පළාත හැර අනෙකුත් පළාත් හතෙහි ප්‍රගතිය සියයට 32 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් පළාත් පාලන කොමසාරිස්වරුන් 9දෙනා ඇතුළු සාමාජිකයන් 14 දෙනෙකුගෙන් සමන්විත වී තිබූ කොමසාරිස් මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී හතර වතාවක් පමණක් රැස්ව තිබුණු අතර ණය අනුමත කිරීම හා අනෙකුත් කළමනාකරණ තීරණ ගැනීම සඳහා කොමසාරිස් මණ්ඩලය විසින් සිදුකරන බැවින් කොමසාරිස් මණ්ඩලයේ අඩු දායකත්වයක් පැවතීම අරමුදලේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) 1993 අංක 24 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත මගින් සංශෝධිත 1916 අංක 22 දරන දේශීය ණය සහ සංවර්ධන ආඥා පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව, කාර්ය මණ්ඩලය පත්කිරීමේ බලතල කොමසාරිස් මණ්ඩලය සතු වුවද කොමසාරිස් මණ්ඩලයේ අනුමැතියකින් තොරව එවකට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම / රාජකාරි ඉටුකිරීම

10

සඳහා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කර තිබුණි. තවද, එම නිලධාරියා වෙනුවෙන් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය හා 12:8 වගන්තියට පටහැනිව රු. 176,248 ක සහ 2008 ජූලි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/50 හි 5 ඡේදය හා 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 හි රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7 ඡේදයට පටහැනිව ප්‍රවාහන දීමනා රු. 270,000ක් හා ඉන්ධන දීමනා රු. 171,010ක් ලෙස එකතුව රු. 617,258ක් ගෙවා තිබුණි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

ආයතනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබූ අතර රේඛීය අමාත්‍යාංශය මගින්ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සම්බන්ධයෙන් වරින්වර ආයතනයේ සභාපතිවරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i) ආයතනයේ ගනුදෙනු නිසි පරිදි සටහන් කිරීම හා ගිණුම් පොත්පත් නිවැරදිව පවත්වා නොගැනීම. (ii) ආයතනය විසින් 2012 වර්ෂයේදී මිලදී ගෙන, ස්ථාපිත කළ පරිගණක පද්ධතිය භාවිතා කර ගිණුම්කරණ මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම.
(ආ) ණය අයකර ගැනීම පාලනය	ආයතනයට ලැබිය යුතු සියලුම ණය වාරික සහ පොළිය අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් දියත් නොකිරීම.

ඩබ්ලිව්. පී. සී වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

11

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	2015 රු. ශත.	2014 රු. ශත.
ආදායම			
පොළී ආදායම	19	279,685,699.97	323,611,441.91
භාණ්ඩාගාර ණය පොළී	20	(152,715,453.30)	(159,448,822.07)
දළ ආදායම		**126,970,246.67**	**164,162,619.84**
වෙනත් ආදායම්	21	441,966.01	670,316.06
පරිපාලන වියදම්	22	(27,851,969.80)	(25,991,061.44)
පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන	23	(89,883,001.70)	(195,102,503.09)
මෙහෙයුම් ලාභය		**9,677,241.18**	**(56,260,628.63)**
ණය හානිකරණය සහ අනෙකුත් අලාභයන්		(26,441,969.00)	(98,819,054.65)
මූල්‍ය වියදම්		-	-
මූල්‍ය ආදායම	24	21,937,368.12	18,966,702.40
බදු ගෙවීමට පෙර ලාභය		**5,172,640.30**	**(134,112,980.88)**
ආදායම් බදු ගෙවීම්		(946,136.00)	(1,300,000.00)
ආදායම් බදු වෙන්කිරීම්		-	-
බදු ගෙවීමෙන් පසු ලාභය		**4,226,504.30**	**(135,412,980.88)**
ඒකාබද්ධ අරමුදලට ගෙවීම්		-	-
ශුද්ධ ලාභය		4,226,504.30	(135,412,980.88)
වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම්		(939,752,302.09)	(804,339,321.21)
වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම්		**(935,525,797.79)**	**(939,752,302.09)**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2015 (රු.)	2014 (රු.)
වත්කම්			
දිගුකාලීන වත්කම්			
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	1	16,069,191.60	18,752,097.50
මූල්‍ය වත්කම් ආයෝජන කල්පිරීම්	2	127,296,453.58	296,085,567.43
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	3	1,234,281,467.99	1,527,466,141.02
සේවක ණය	4	5,059,368.52	4,132,682.51
මුළු දිගුකාලීන වත්කම්		**1,382,706,481.69**	**1,846,436,488.46**
ජංගම වත්කම්			
ණය ගැතියෝ	5	3,231,889,975.71	3,350,479,316.58
ලැබිය යුතු ණය පොළී	6	193,335,396.12	195,286,932.80
ආපසු ලබාගතහැකි තැන්පතු		40,051.61	40,051.61
ලැබිය යුතු ආයෝජන ආදායම් (UDLIHP)	7	2,522,742.00	2,522,742.00
අවිනිශ්චිත ගිණුම - ප.පා.ය.ප.වැ.ව		-	199,054.38
මූල්‍ය ශේෂය (PMU)		19,500,745.64	19,500,745.64
මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය	8	282,014,936.93	78,105,724.11
මුළු ජංගම වත්කම්		**3,729,303,848.01**	**3,646,134,567.12**
මුළු වත්කම්		**5,112,010,329.70**	**5,492,571,055.58**
වගකීම්			
රඳවාගත් ඉපැයුම්	9	(935,525,787.79)	(939,752,302.09)
මුළු සමකොටස්		(935,525,787.79)	(939,752,302.09)

වගකීම්			
දිගුකාලීන වගකීම්			
භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	10	2,006,099,126.54	2,119,104,945.05
ගෙවිය යුතු ණය - ප.පා.ය.ප.වැ.ව	11	3,551,530,832.49	3,551,530,832.49
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	12	392,754,314.94	596,055,986.27
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	13	2,915,417.20	2,348,607.37
ගෙවිය යුතු රඳවාගැනීම්		-	-
රාජ්‍ය අනුග්‍රහය (ප්‍රාග්ධන) - ප.පා.ය.ප.වැ.ව	14	5,275,731.07	6,075,231.07
මුළු දිගුකාලීන වගකීම්		**5,958,575,422.24**	**6,275,115,602.25**
ජංගම වගකීම්			
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු පොළී	15	21,765,947.75	117,095,176.89
අවිනිශ්චිත පොළී ලැබීම්		22,063,699.27	-
උපචිත වියදම් වෙන්කිරීම්	16	8,887,813.00	9,043,144.92
පෙර වර්ෂය සඳහා ලැබීම්	17	15,623,576.97	10,990,972.47
බදු වගකීම	18	1,118,912.62	577,715.50
ජංගම වගකීම් - ප.පා.ය.ප.වැ.ව		19,500,745.64	19,500,445.64
මුළු ජංගම වගකීම්		**88,960,695.25**	**157,207,755.42**
මුළු වගකීම්		**5,112,010,329.70**	**5,492,571,055.58**

එච්.ටී.කේ.පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම් - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය)

ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න
භාණ්ඩාගාර නියෝජිත
කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)

....

ඒ.කේ.පී.එස්.අමරසිරි
ප්‍රධාන විධායක නිලධාරී
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)
2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2015**	**2014**
	(රු.)	(රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
බදු ගෙවීමට පෙර ලාභය	(119,510,657.34)	(134,112,980.88)
එකතුකිරීම්		
පොළී ගෙවීම්	-	-
පොළී ලැබීම්	(21,937,368.12)	(18,966,702.40)
ක්ෂය වෙන්කිරීම්	3,270,293.40	2,245,807.60
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	566,809.83	565,917.08
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-
අවිනිශ්චිත ගිණුම	22,262,753.65	(199,054.38)
කාරක ප්‍රාග්ධනයේ ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය	**(115,348,168.58)**	**(150,467,012.98)**
අඩුවීම / වැඩිවීම - ණය ගැතියෝ	155,741,641.21	86,483,415.70
අඩුවීම / වැඩිවීම - ප්‍රධාන - ප.පා.ය.ප.වැ.ව	293,184,673.03	318,907,755.43
අඩුවීම / වැඩිවීම - පෙර වර්ෂය සඳහා ලැබීම්	4,632,604.50	(753,527.11)
අඩුවීම / වැඩිවීම - සේවක ණය ගැතියෝ	(926,686.01)	(877,483.00)
අඩුවීම / වැඩිවීම - භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය පොළී	(95,329,229.14)	(70,000,000.20)
අඩුවීම / වැඩිවීම - වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ගෙවීම්	(155,331.92)	1,062,705.92
අඩුවීම / වැඩිවීම - ලැබීම්	(113,005,818.51)	(117,185,841.82)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්	**128,793,684.58**	**67,170,011.94**
භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	-	-
පොළී ලැබීම්	21,937,368.12	18,966,702.40
රඳවාගැනීම් බදු	(404,938.88)	(1,280,876.65)
ආදායම් බදු ගෙවීම්	-	(1,340,629.93)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**150,326,113.82**	**83,515,207.76**
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	(587,387.50)	(18,148,926.40)
ස්ථාවර වත්කම් බැහැර කිරීම	-	-
ස්ථාවර තැන්පතු	205,000,000.00	-
භාණ්ඩාගාර බිල්පත්	(36,210,886.15)	(542,556.05)
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**168,201,726.35**	**(18,691,482.45)**
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ණය නිකුත්කිරීම්	(799,500.00)	-
ණය අයකිරීම්	(113,819,127.35)	(164,468,551.68)
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(114,618,627.35)**	**(164,468,551.68)**
අඩුවීම / වැඩිවීම - වර්ෂය තුළ වූ මූල්‍ය විචල්‍යයන්	**203,909,212.82**	**(99,644,826.37)**
වර්ෂය ආරම්භයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**97,606,469.75**	**197,251,296.12**
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**301,515,682.57**	**97,606,469.75**

සටහන A

මූල්‍ය විචලයයන්	**2015**	**2014**
	රු. ශත	රු. ශත .
ඉතිරි කිරීමේ ගිණුම	484,004,042.15	99,097,476.70
මුදල් ශේෂය PMU	19,500,745.64	19,500,745.64
බැංකුවේ ඇති මුදල්	(201,989,105.22)	(20,991,752.59)
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යයන්ගේ ශේෂය	**301,515,682.57**	**97,606,469.75**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
ශේෂ පත්‍රය සඳහා සටහන්
2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1 **ස්ථාවර වත්කම්**
පිරිවැය

විස්තරය	01.01.2015 දිනට පිරිවැය	එකතු කිරීම්/ බැහැරකිරීම්	31.12.2015 දිනට පිරිවැය
කාර්යාල ගොඩනැගිලි	2,243,681.66	113,787.50	2,357,469.16
ගෘහභාණ්ඩ සහ උපකරණ	5,150,872.62	473,600.00	5,624,472.62
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	6,895,602.00	-	6,895,602.00
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	4,511,406.98	-	4,511,406.98
මෝටර් රථ - නිසාන් Xtrail	**7,995,000.00**	-	7,995,000.00
එකතුව	**26,796,563.26**	**587,387.50**	**27,383,950.76**

සමුච්චිත ක්ෂය වෙන්කිරීම්

විස්තරය	01.01.2015 දිනට ශේෂය	අදාළ වර්ෂය සඳහා ක්ෂය	31.12.2015 දිනට ශේෂය
කාර්යාල ගොඩනැගිලි	1,980,153.93		2,055,616.98
ගෘහභාණ්ඩ සහ උපකරණ	1,169,660.09	75,463.05	1,444,958.17
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	1,854,137.35	275,298.08	2,862,430.28
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	2,241,014.39	1,008,292.93	2,553,253.73
මෝටර් රථ - නිසාන් Xtrail	799,500.00	312,239.34	2,398,500.00
එකතුව	**7,244,965.76**	**3,270,293.40**	**11,314,759.16**

ලියා හරින ලද අගය	**19,551,597.50**		**16,069,191.60**

02	මූල්‍ය වත්කම් - ආයෝජන කල්පිරීම්	2015	2014
	ස්ථාවර තැන්පතු	31,855,292.05	236,855,292.05
	භාණ්ඩාගාර බිල්පත්	95,441,161.53	59,230,275.38
		127,296,453.58	**296,085,567.43**

03	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන (ප.පා.ය.ප.වැ.කි.ව)	2015	2014
	2015 වර්ෂයේදී ප. පා. ආයතන වෙත ලබාදුන් ප්‍රදාන	2,841,795,121.45	2,841,795,121.45
	අඩුකලා - ප්‍රදාන (2015 ක්‍රමක්ෂය)	(1,607,513,653.46)	(1,314,328,980.43)
		1,234,281,467.99	**1,527,466,141.02**

04	සේවක ණය	2015	2014
	ආපදා ණය	4,709,468.52	4,098,682.51
	කොමසාරිස් මණ්ඩල අත්තිකාරම්	329,400.00	-
	උත්සව අත්තිකාරම්	20,500.00	34,000.00
		5,059,368.52	**4,132,682.51**

05	දිගුකාලීන වත්කම් - ණය ගැතියෝ	2015	2014
	දේ.ණ.ස.අ (ම.න.ස, න.ස සහ ප්‍රා.ස)	944,012,416.91	792,304,472.38
	නා. සං. සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	1,511,126,201.48	1,616,213,801.13
	ප. පා. ය.ප. වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,482,905,605.75	1,619,525,855.00
	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	66,198,530.41	67,847,622.91
	ජාතික ජල සම්පාදන සහ ජලාපවාහණ මණ්ඩලය	8,219,130.22	8,717,505.22
		4,012,461,884.77	**4,104,609,256.64**
	අඩු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්		
	2015.01.01 දිනට ශේෂය	754,129,940.06	657,310,885.41
	එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	26,441,969.00	96,819,054.65
		780,571,909.06	**754,129,940.06**
	2015.12.31 දිනට ශේෂය	**3,231,889,975.71**	**3,350,479,316.58**

6	ලැබිය යුතු පොළී - දිගුකාලීන	2015	2014
	ලැබිය යුතු ණය පොළී - LLDF	23,917,564.30	24,350,084.30
	ලැබිය යුතු පොළී - UDLIHP	92,611,890.63	95,143,335.83
	ලැබිය යුතු පොළී - PCDP	4,680.00	-
	ලැබිය යුතු පොළී - LGIIP	75,757,996.15	74,750,247.63
	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොළී - LGIIP	-	-
	ලැබිය යුතු ප්‍රමාණීකෘත වන්දි - LGIIP	1,043,265.04	1,043,265.04
	ලැබිය යුතු අමතර පොළී - LGIIP	-	-
	ජා.ජ.ස. සහ ජලාපවහන මණ්ඩලය	-	-
		193,335,396.12	**195,286,932.80**

අක්‍රිය ණය - LL&DF	-	-
අක්‍රිය ණය - PCDP	-	-
අක්‍රිය ණය - UDLIHP	-	-
	193,335,396.12	**195,286,932.80**

7 ලැබිය යුතු ආයෝජන ආදායම් - UDLIHP	2015	2014
ලැබිය යුතු පොළී (භාණ්ඩාගාර බිල්පත්) - UDLIHP	1,306,001.00	1,306,001.00
ලැබිය යුතු පොළී (ස්ථාවර තැන්පතු) - UDLIHP	1,216,741.00	1,216,741.00
	2,522,742.00	**2,522,742.00**

8 මූල්‍ය විචල්‍යයන්	2015	2014
ඉතිරි කිරීමේ ගිණුම	484,004,042.15	99,097,476.70
අතැති මුදල්	(201,989,105.22)	(20,991,752.59)
	282,014,936.93	78,105,724.11

9 රඳවාගත් ඉපැයුම්	2015	2014
2015.01.01 දිනට ශේෂය	(939,752,302.09)	(804,339,321.21)
2015 වර්ෂය සඳහා	4,226,514.30	(135,412,980.88)
	(935,525,787.79)	(939,752,302.09)

10 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	2015	2014
භාණ්ඩාගාර ණය අරමුදල්	215,192,375.25	231,393,165.24
නා.ස.අ.ආ.නි.ව	1,724,989,810.44	1,815,794,838.96
බහු.හෝ.සං.ව්‍යා	65,916,940.85	65,916,940.85
	2,006,099,126.54	2,119,104,945.05

11 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	2015	2014
ප.පා.ය.ප.වැ.ව	3,551,530,832.49	3,551,530,832.49
	3,551,530,832.49	3,551,530,832.49

12 පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - ප.පා.ය.ප.වැ.ව	2015	2014
ප්‍රදාන - ලැබීම්	1,102,964,884.09	1,102,964,884.09
අඩුකළා - 2015 ප්‍රදාන ක්‍රමක්ෂය	(710,210,569.15)	(506,908,897.82)
	392,754,314.94	596,055,986.27

13 පාරිතෝෂික ගෙවීම්

	2015	2014
පාරිතෝෂික වෙන්කිරීම්	2,348,607.37	1,782,690.29
වර්ෂය සඳහා වෙන්කිරීම්	566,809.83	565,917.08
	2,915,417.20	2,348,607.37
වර්ෂය සඳහා පාරිතෝෂික ගෙවීම්	-	-
	2,915,417.20	2,348,607.37

14 මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් වාරික - ප.පා.ය.ප.වැ.ව

	2015	2014
වත්කම් - LGIIP (පිරිවැය)	7,500,110.62	7,500,110.62
අඩුකළා - භාණ්ඩාගාරයෙන් ලැබීම් (ක්‍රමක්ෂය)	(2,224,379.55)	(1,424,879.55)
	5,275,731.07	6,075,231.07

15 මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු පොළී

	2015	2014
ගෙවිය යුතු පොළී UDLIHP	21,765,947.75	117,095,176.89
ගෙවිය යුතු පොළී PCDP	-	-
ගෙවිය යුතු පොළී LGIIP	-	-
	21,765,947.75	117,095,176.89

16 උපචිත වියදම් සඳහා වෙන්කිරීම්

	2015	2014
විගණන ගාස්තු	1,645,813.00	1,645,813.00
ආදායම් බදු	7,200,000.00	7,200,000.00
උපචිත වියදම්	24,000.00	197,331.92
	8,887,813.00	9,043,144.92

17 කලින් ලැබීම්

	2015	2014
කලින් ලැබීම් LLDF	2,662,767.18	1,426,709.72
කලින් ලැබීම් UDLIHP	5,849,401.20	3,015,506.00
කලින් ලැබීම් LGIIP	7,111,408.59	7,302,283.86
	15,623,576.97	11,744,499.58

18	ජංගම බදු වගකීම	2015	2014
	වර්ෂයේ ආරම්භක ශේෂය	577,715.50	1,899,222.08
	එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	946,136.00	1,300,000.00
		1,523,851.50	3,199,222.08
	අඩු කළා - 2013/2014 වර්ෂ සඳහා ගෙවීම්	-	(1,340,629.93)
	2014/2015 වර්ෂ සඳහා ගෙවීම්	-	-
	අඩු කළා - රඳවාගැනීමේ බදු	(404,938.88)	(1,280,876.65)
	2015.12.31 දිනට ශේෂය	1,118,912.62	577,715.50

19	පොළී ආදායම	2015	2014
	LLDF	81,136,093.89	54,386,062.03
	UDLIHP	71,283,893.05	120,567,659.50
	PCDP	4,963,971.00	5,105,948.50
	LGIIP	121,478,644.03	142,681,703.28
	NW&DB	823,097.90	870,068.60
		279,685,699.87	323,611,441.91

20	පොළී වියදම	2015	2014
	LLDF	16,926,385.93	18,642,043.92
	UDLIHP	95,329,229.05	100,096,493.06
	PCDP	4,944,531.00	5,194,976.77
	LGIIP	35,515,308.32	35,515,308.32
		152,715,454.30	159,448,822.07

21	වෙනත් ආදායම්	2015	2014
	අවිනිශ්චිත ලැබීම්		
	LLDF	-	-
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	-	-
	ද්‍රවශීලතා හානිකරණ ආදායම		
	LLDF	-	-
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	167,133.89	527,555.45
	වෙනත් ආදායම්		
	LLDF	274,832.12	142,760.61
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	-	-
		441,966.01	670,316.06

22 පරිපාලන වියදම්	2015	2014
කාර්යමණ්ඩල වැටුප්	11,186,753.92	8,197,134.51
ජීවනාධාර දීමනාව	2,948,660.00	2,862,600.00
ප්‍රසාද දීමනා	-	804,375.00
සභාපති දීමනා	842,832.50	475,590.00
දිරි දීමනා - UDLIHP	74,000.00	489,324.00
කොමසාරිස් මණ්ඩල ප්‍රවාහන දීමනා	201,880.00	163,380.00
කොමසාරිස් මණ්ඩල දීමනා	9,000.00	722,400.00
E.P.F	1,656,933.50	1,267,967.46
E.T.F	414,233.38	316,991.86
පාරිතෝෂික දීමනා ගෙවීම්	566,809.83	567,917.08
අතිකාල සහ නිවාඩු දින වැටුප්	131,563.67	224,912.84
කාර්යමණ්ඩල සුභසාධක වියදම්	165,814.00	236,869.32
දුරකථන දීමනා	35,928.58	-
සංවර්ධන නිලධාරී දීමනා	125,787.10	-
රැස්වීම් වියදම්	105,771.00	94,849.10
විගණන ගාස්තු ගෙවීම්	169,358.33	360,000.00
දුරකථන සහ තැපැල්	361,809.17	405,998.39
ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ වියදම්	597,441.96	573,538.19
වාහන නඩත්තු වියදම් - 54/6233	67,055.00	54,400.00
ඉන්ධන	204,387.75	405,668.43
විදුලි ගාස්තු	620,014.12	565,739.65
ආරක්ෂක ගාස්තු	392,341.64	356,474.40
ජල ගාස්තු	34,215.44	52,025.50
පවිත්‍රතා වියදම්	254,745.00	262,339.00
උපකරණ සහ නඩත්තු	126,583.23	419,541.57
ගොඩනැගිලි නඩත්තු	765,647.68	468,022.95
කාර්යමණ්ඩල පුහුණු	268,705.00	376,716.00
පරිගණක නඩත්තු වියදම්	1,318,576.00	641,930.00
කාර්යාල කුලී	101,110.00	701,110.00
වැඩමුළු	-	200,000.00
උපකරණ ක්ෂය	75,463.05	82,899.06
ගෘහභාණ්ඩ ක්ෂය	275,298.08	1,051,169.20
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග ක්ෂය	1,008,292.93	-
LLDF නවීකරණ වත්කම් ක්ෂය	312,239.34	312,239.34
මෝටර් වාහන ක්ෂය	1,599,000.00	799,500.00
නීතිඥ ගාස්තු	-	-
බැංකු ගාස්තු	13,053.73	9,695.18
සංවර්ධන නිලධාරී - ගමන් වියදම්	820,664.87	1,162,536.41
	27,851,969.80	25,991,061.44

23	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - LGIIP	2015	2014
	ප්‍රදාන ක්‍රමක්ෂය - වියදම	293,184,673.03	318,907,755.43
	ප්‍රදාන ක්‍රමක්ෂය - ආදායම	(203,301,671.33)	(123,805,252.34)
		89,883,001.70	195,102,503.09

24	මූල්‍ය ආදායම	2015	2014
	පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්		
	LLDF	914,363.75	870,127.75
	UDLIHP	2,371,411.24	2,648,651.17
	PCDP	-	-
	LGIIP	889,279.21	993,244.15
	පොළී ආදායම - REPO ආයෝජන		
	LLDF	708,424.47	-
	UDLIHP	1,155,846.31	-
	LGIIP	1,506,225.92	-
	පොළී ආදායම - ඉතිරි කිරීමේ ගිණුම		
	LLDF	774,738.57	996,674.83
	UDLIHP	815,708.37	2,381,857.52
	PCDP	-	-
	LGIIP	1,171,952.12	3,945,923.01
	පොළී ආදායම - ස්ථාවර තැන්පතු		
	LLDF	11,398,436.67	2,180,367.14
	UDLIHP	138,630.14	4,854,038.36
	PCDP	-	-
	LGIIP	92,351.35	95,818.47
		21,937,368.12	18,966,702.40

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්තාමය ඒකකය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LL&DF) නෛතික ඒකකයක් වශයෙන් 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන ආඥා පණත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආංශික මූල්‍ය ප්‍රකාශයන්ද එහි, උප කාර්යයන්ද ආවරණය කරයි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මෙහෙයුම් තුල ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති වල ණය අයකිරීම් සිදුකරනු ලබයි. එනම් නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) යන උපාංග වේ.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2008 සිට දේශීය ණය සහ සංවර්ධන අරමුදල තුල ක්‍රියාත්මක වේ. 2015 වර්ෂවල ගිණුම් සහ මූල්‍ය ප්‍රතිඵල ඒකාබද්ධ කර ඇත.

අනුකූලතා ප්‍රකාශන

ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා ගැලපීම් නොකොට ඒකාග්‍රතාවය සලකා ඇතත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට ලක් කොට ඇත.

ශ්‍රිතීය හා ඉදිරිපත් කිරීමේ මුදල්

ආසන්න ශතයට ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

ප්‍රමාණවත් බව හා එක්කාසු කිරීම

සමාන කාර්‍යයන් හා ස්වභාවයන් එක්කාසු කරමින් ප්‍රමාණවත් අයිතමයන් වෙන්ව දක්වා ඇත.

ඒකාබද්ධ කිරීමේ පදනම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල, නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP), පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) උපාංශයන් වශයෙන් හඳුනාගෙන, ඍජු ආදායම් හා වියදම් වෙන්ව දක්වමින්, වර්ෂාවසානයේ එකට ඒකාබද්ධ කොට ඇත. වත්කම් හා වගකීම්ද ශේෂ පත්‍රය තුල ඒකාබද්ධ කොට ඇත.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්‍යයන් (ව්‍යාපෘතියේ B උපාංගය) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පවරා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) මගින් එය ක්‍රියාත්මක වේ. එම අංශය තුල එහි මූල්‍ය ප්‍රකාශන වෙනම පිළියෙල කරනු ලැබේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලට බලනොපාන මෙහෙයුම් වියදම් හා A උපාංගයට නිකුත් කරන ලද මුදල් හැර සියළුම වත්කම් හා වගකීම් ගිණුම් වල තොරතුරු දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ගිණුම් තුල ඒකාබද්ධ කොට ඇත.

ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන සෘජුව දේශීය ණය සහ සංවර්ධන අරමුලට මාරු කරන ලද වත්කම්ද B උපාංගය සඳහා දෙන ලද ණය හා ප්‍රදානයන් හා ඒ සම්බන්ධ ගනුදෙනුද, ඒකාබද්ධ ප්‍රකාශයන්ට පෙර උපාංග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන ඇත.

මුදල් හා මුදල් තුලනයන්

මුදල් හා මුදල් සමානායයන් තුල අතැති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පත් අදාළ බැංකු ගිණුම් වල ශේෂයන් අන්තර්ගතය. ඒවායේ මතුපිට අගය මත ශේෂය ඉදිරියට ගෙන ඇත.

බැර හා හර ප්‍රදානයන්ගේ ක්‍රමක්ෂය

බැර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) B උපාංගය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය සමග පළාත් පාලන ආයතන වලට නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්ය. හර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන ආයතන වෙත ණය සමග නිකුත් කරන ලද ආධාර මුදල්ය. වියදමක් වශයෙන් සලකන ලද හර ප්‍රදානයන් අදාල කාර්‍යයෙන් ලැබෙන පොළී වලට අනුකූලව ක්‍රමවත් පදනමකට වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර එම පදනමට අනුකූලව බැර ප්‍රදානයන්ද ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම වැඩපිළිවෙලේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ බදුවලට පෙර ඒකාබද්ධ ලාභය බද්දට පෙර හා ශුද්ධ ක්‍රමක්ෂයට පෙර ලාභයෙන් 5% කට වඩා අඩු නොවිය යුතුය.

අක්‍රිය ණය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව දීර්ඝ කාලයක් නොලැබී තිබූ ණය වල ප්‍රාග්ධන කොටස හා පොළිය අක්‍රිය වූ ණය හා පොළී ලෙස සලකා පොළිය අවිනිශ්චිත වූ පොළී ගිණුමක උපචිත කරන අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

පාඩු වූ ණය සඳහා ප්‍රතිපාදන

පාඩු වූ ණය හා සැක සහිත ආපසු අයකරගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ ප්‍රතිපාදනයන් කරනු ලැබේ.

අක්‍රීය ණය මත ආදායම් හඳුනාගැනීම

කිසියම් අත්තිවාරමක්/ ණයක් අක්‍රීය ලෙස සැලකූ කල පොළිය ආදායමක් වශයෙන් ගැනීම අත්හිටුවන අතර මුදල් පදනම මත පමණක් එය ආදායමට ගනු ලැබේ.

ක්ෂයවීම්

එක් එක් වත්කම් පංතිය අනුව පහත සඳහන් ලෙස සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ප්‍රතිපාදනය කරනු ලැබේ.

සවිකිරීම්	-	25%
කාර්‍යාල උපකරණ	-	20%
කාර්‍යාල ලී බඩු	-	05%
වාහන	-	20%

වත්කම් මිලයට ගත් වර්ෂයේ ක්ෂය වීම් ගණනය කරනු නොලැබේ.

දේපල හා යන්ත්‍රෝපකරණ

දේපල හා යන්ත්‍රෝපකරණ ඒවා මිලට ගත් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය හෝ අනියම් වියදම් සහිත අගය කිරීම් වලින් ක්ෂයවීම් අඩු කොට වාර්තා කරනු ලැබේ. ඉදිකිරීම් වත්කම් භාවිත තත්වයට ගෙන ඒම සඳහා වූ වියදම් සියල්ල පිරිවැය තුල අන්තර්ගතය. කොන්ත්‍රාත් මත වූ ඉදිකිරීම් වල ගෙවන ලද කොන්ත්‍රාත් මිල ප්‍රාග්ධනිත කර ඇත.

ණය ප්‍රාග්ධනිත කිරීම

උප ව්‍යාපෘතීන් හි වැඩ කෙරීගෙන යන කාලය තුල නිකුත් කරන ලද ණය මුදල් වල පොළිය වැඩ අවසානයේ ණය මුදලට එකතු කොට මූලික මුදල සමග වාරික වශයෙන් ගෙවීමට කටයුතු යොදා ඇත. රඳවා ගැනීම් වලට පෙර අවසාන අතුරු ගෙවීම් දිනය එසේ පොළී ප්‍රාග්ධනිත කිරීම සඳහා ලුහු කාඨිය (cut off) දිනය වශයෙන් ගනු ලැබේ.

වගකීම්

ගෙවිය යුතු බිල් හා අනෙකුත් වගකීම් වල සියළුම මූල්‍ය වගකීම්, භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොළිය හා ගෙවිය යුතු ගාස්තු හා වියදම් ඇතුලත්ය.

පාරිතෝෂික

ස්ථිර සේවකයන්ගේ දළ වැටුපේ ප්‍රතිශතයක් වශයෙන් ඔවුන්ගේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අර්ථ සාධක අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදල සේවක අර්ථසාධක අරමුදලට 12% ක් දායක වන අතර සේවකයන්ගේ දායකත්වය 8% ක් වේ.

භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදලට දේශීය ණය සහ සංවර්ධන අරමුදල 3% ක දායකත්වයක් සපයයි.

ආදායම් ප්‍රකාශන

පොළී ආදායම්

ලැබිය යුතු පොළී උපචිත පදනමට ගණනය කරනු ලැබේ. අක්‍රීය ණය වල පොළිය අවිනිශ්චිත පොළී ගිණුමක සමුච්චය කොට මුදල් පදනමට ආදායමට හඳුනාගනු ලැබේ.

පොළී හා වෙනත් වියදම්

ගෙවිය යුතු පොළී හා වෙනත් වියදම් උපචිත පදනමට හඳුනාගෙන ඇත.

ණය සහ ගිවිසුම්

2006.01.19 දින ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කල ණය අංක 2201 SRI (SF) ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් අනුව පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ B උපාංගය යටතේ ඇමරිකානු ඩොලර් 42.5 ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට වෙන්කොට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන, වර්ගයට අනුව වෙනස් වන අනුපාතයකට ණය හා ආධාර ලබා ගනී.උප ණය ගිවිසුමේ 1.01 ඡේදයට අනුව හා ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කළ ණය ගිවිසුමේ 3.01 (a) ඡේදයට අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට දෙනු ලබන ණය ප්‍රමාණය විශේෂ හර ගැණුම් දෙසිය හතලිස් හය ලක්ෂ හැට හත් දහසක (SDR 24,667,000) කට සමාන මුදලකි, ණය ආපසු ගෙවීම, වසර 32 ක් තුල ත්‍රෛයිමාසිකව වාර 96 කින් වසර 08 ක සහන කාලයක් සහිතව හමාර කළ යුතුය.

පොළී ගෙවීම සහන කාලය තුල 1% ක් ද එයින් පසුව 1.5% ක් ද වේ. එය ත්‍රෛයිමාසික වාරය අවපාතයේ තිබූ ණය ශේෂය පදනම් කොටගෙන සිදුවේ.

පළාත් පාලන ආයතනයන්ට දෙන ලද ණය මුදල සඳහා 9% පොළියක් අයකරන අතර ආධාර ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අරමුදල් වල පොළී ආන්තිකයෙන් ආවරණය කරගත යුතු වේ. ඒ නිසා අරමුදල් කළමනාකරණය දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අනාගතයට දැඩි බලපෑමක් ඇති කරයි.

එච්.ටී.කමල් පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම්- පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය)